**ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා - 2022**

**-----------------------------------------------------------------**

## 1. විගණන මතය

1.1 ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 33 හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

2023 ඔක්තෝබර් 12 දින වන විට 2022 වර්ෂයට අදාළව ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 33 කට අදාළව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම වාර්තාවල කාරක 33 හි ම තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කිරීම සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන**

### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකුව, ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් බැවින් කාරක සභා 33 ම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 75/12 ගි.වා. පොදු හා 2022 ජනවාරි 11 දිනැති ලිපි මඟින් ලබාදී ඇති උපදෙස් හා ආකෘති අනුව ගිණුම් පිළියෙල කර ඇති බව. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 සහ 2012 පෙබරවාරි 29 දිනැති චක්‍රලේඛයේ 5.6(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 14 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඒ බව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි. | එකඟවන බව හා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 17 ක් විසින් ප්‍රවර්ථන වර්ෂය තුලදී මිලදී ගනු ලබන හා ඉවත්කරනු ලබන ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලබන පදනම ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි. | එකඟවන බව හා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 06 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ | එකඟවන බව හා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව |

| | | |
|---|---|---|
| ප්‍රමිති අංක 07 හි 86 (ආ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල එක් එක් දේපල පිරියත හා උපකරණ පන්තිය සම්බන්ධයෙන් භාවිතා කළ ක්ෂය කරන ක්‍රම ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි. | බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඉ) කොග්ගල ගොවිජන සේවා කාරක සභාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ අක්කර බදු උපචිත පදනමට ගිණුම් තබන බව දක්වා තිබුණද මුදල් පදනමට ගිණුම් තබා තිබුණි. | පිළිතුරු සපයා නැත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති නිවැරදිව හෙළිදරව් කළ යුතුය. |

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 33 ක ඉඩම් හා ගොඩනැගිලි සහ කාරක සභා 14 ක පරිගණක 28 ක්, ප්‍රින්ටර් 14 ක් හා ඒවායේ උපාංග, කාරක සභා 02ක තණකොල කපන යන්ත්‍ර 04 ක්, ගොවිජන සේවා කාරක සභාවක පරිගණක මේස 02 ක්, පරිගණක පුටු 02 ක්, වානේ කබඩ් 04ක්, නිලධාරී පුටු 02 ක් යන ස්ථාවර වත්කම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වන බව හා ඒවායේ වටිනාකම් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 09 ක මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබෙන යන්ත්‍රෝපකරණ හා වාහන, ගොඩනැගිලි, පැළ කුටි, ජලනල සවි කිරීම්, කෘෂි ළිඳ , ක්ෂය කර අවසන් කර තිබුණද කාරක සභා 03 ක එම වත්කම් රු.1 ක් ලෙස දක්වා තිබුණි. කාරක සභා 05 ක වත්කම් ශූන්‍ය ලෙස දක්වා තිබුණු අතර කොග්ගල ගොවිජන සේවා කාරක සභාවේ සිබිව්රා ට්‍රැක්ටරය සහ ඇල්පිටිය ගොවිජන සේවා කාරක සභාවේ තාවකාලික ගොඩනැගිලි, භෞතිකව නොපැවතුණි. | එකඟවන බව හා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | භෞතිකව නොපවතින වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමටත් ක්ෂය කර අවසන් වූ භෞතිකව පවතින වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල ගැලපීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | වසර ගණනාවක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබෙන කාරක සභා 03 ක | එකඟවන බව හා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ජීව විද්‍යාත්මක වත්කම් |

| | | | |
|---|---|---|---|
| | තේ වගා කිරීමේ වියදම් රු.980,000 ක් ද කාරක සභා 02 ක කුරුඳු වගා කිරීමේ වියදම් රු.181,339 ක්ද, ඕපාත ගොවිජන සේවා කාරක සභාව පොල් හා අන්නාසි වගා කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු.25,000 ක් හා රු.30,000 ක් වැය කර තිබුණි. මෙම වත්කම් ජීව විද්‍යාත්මක වත්කම් ලෙස ගිණුම්වල ගලපා නොතිබුණු අතර තේ වගා කිරීම වෙනුවෙන් වැය කර තිබුණු රු.45,800 ක් මූල්‍ය කාරක සාධන ප්‍රකාශයේ වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි. | | මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | ඉඩම් කැබලිකර විකුණන සමාගමක් විසින් ඉඩමක් කැබලිකර විකිණීමේදී ඇල මාර්ගයකට සිදුවිය හැකි හානි වෙනුවෙන් ගාල්ල දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය මත රු.500,000 ක් වලහන්දුව ගොවිජන සේවා කාරක සභාවට ගෙවා තිබුණි. ඉදිරි වර්ෂ වලදී ඇල මාර්ගය නඩත්තු කිරීම වෙනුවෙන් ලබාගෙන තිබුණු මෙම මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | එකඟ වන බව. | ඇල මාර්ග නඩත්තු කිරීම වෙනුවෙන් ලැබුණු මුදල් තැන්පත් ගිණුමට ගිණුම්ගත කළ යුතුය. |

**1.2.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 14 ක ගිණුම් විෂයයන් 05 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර ශේෂයන්හි එකතුව රු.88,529,312 ක නොසැසඳීම් පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නොසැසඳීම් නිවැරදි කළ යුතුය. |

**1.2.4 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ගොවිජන සේවා කාරක සභා 05 ක වූ රු.151,442 ක අවිනිශ්චිත ගිණුම් හර ශේෂ සහ ගොවිජන සේවා කාරක සභා 03 ක වූ රු.23,459 ක අවිනිශ්චිත ගිණුම් බැර ශේෂ නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අවිනිශ්චිත ගිණුම් ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුය. |

### 1.2.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 14 ක රු.11,594,226 ක වත්කම් වලට අදාළව සවිස්තරාත්මක සටහන්, තක්සේරු වාර්තා, ශේෂ සනාථන සහතික, ණය ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් සහතික වැනි සාක්ෂි නොතිබුණ අතර ගොවිජන සේවා කාරක සභා 20 කට අදාළව රු.8,648,121 ක වගකීම්වලට අදාළව ණය ලේඛන, ශේෂ සනාථන සහතික, සවිස්තරාත්මක සටහන්, පැන නැගී ඇති ආකාරය, වගකිව යුතු පුද්ගලයින්, කාල විශ්ලේෂණ වැනි සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ගිණුම් විෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | එකඟ වන බව. | හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, හානි පාඩු ලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ශේෂ තහවුරු කිරීමේ ලිපි, උපලේඛන, පැන නැගී ඇති ආකාරය, වගකිව යුතු පුද්ගලයින් වෙනත් තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 1.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| (i) | 51 (1) වගන්තිය | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් එක් එක් ප්‍රදේශයන්හි ගොවිජන සංවර්ධන සභාවක් සංස්ථාපනය කරනු ලැබීමට ක්‍රියා කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 32 ක ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 51 (1) වගන්තිය යටතේ ගොවිජන සංවර්ධන සභාවක් සංස්ථාපනය කිරීමට මෙතෙක් නියෝග සකස් කර නොමැති නිසා ගොවිජන සංවර්ධන සභාවක් ස්ථාපිත කර නැති බව. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) | 53(1) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 05 ක බල ප්‍රදේශය ඇතුළත | පරීක්ෂා කර ඉදිරියේදී සිදු කරන බව. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන |

| | | | | |
|---|---|---|---|---|
| | | කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ ලේඛනයක් පිළියෙල කරනු ලැබ සංශෝධන හා ප්‍රතිශෝධන කර කොමසාරිස් ජනරාල්වරයා විසින් සහතික කර නොතිබුණි. | | පරිදි කටයුතු කළ යුතුය. |
| (iii) | 53(4)(අ) වගන්තිය. | සෑම අවුරුදු 03කට වරක්ම කාරක සභාවේ සෑම ලේඛනයක්ම කොමසාරිස් ජනරාල් විසින් පරීක්‍ෂා කර සහතික කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 11 ක එසේ සහතික කර නොතිබුණි. | පරීක්ෂා කර ඉදිරියේදී සිදු කරන බව. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (iv) | 56(1) වගන්තිය | සෑම කාෂිකාර්මික ඉඩමක් සඳහාම නියම කරනු ලබන අක්කර බදු මුදල් සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර අයකර අවසන් කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 09 ක සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.1,024,824 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවතුණි. | බදු නොගෙවන ගොවීන්ට එරෙහිව නීත්‍යානුකූල කටයුතු කිරීමට පියවර ගන්නා බව. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (v) | 56 (3) හා 56(4) වගන්ති | ගොවිජන සේවා කාරක සභා 05 ක හිඟ මුදල් ගෙවීම පැහැර හරිනු ලබන ගොවීන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | බදු නොගෙවන ගොවීන්ට එරෙහිව නීත්‍යානුකූල කටයුතු කිරීමට පියවර ගන්නා බව. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** --------------------- | | | |
| (i) | 104 මුදල් රෙගුලාසිය | කෙරදේවල ගොවිජන සේවා කාරක සභාවේ 2007 වර්ෂයේදී සේප්පුව සමඟ සොරාගත් රු.97,405 ක් වූ මුදල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 104 මුදල් රෙගුලාසිය | නියාගම ගොවිජන සේවා කාරක සභාවේ 2022 මැයි 30 දින සොරුන් විසින් රැගෙන ගොස් තිබුණු රු.2,400 ක් වූ ERP කිලෝග්‍රෑම් 200 ක් හා නොමිලේ ලද යූරියා කිලෝග්‍රෑම් 450 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 110 මුදල් රෙගුලාසිය | ගොවිජන සේවා කාරක සභා 07 ක හානි පාඩු සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කර නොතිබුණි. | හානි පාඩු ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | 133 මුදල් රෙගුලාසිය | ගොවිජන සේවා කාරක සභා 23 ක ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය සිදු කරන අතර 2022 වර්ෂය සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන පරීක්ෂාව සිදුකර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (v) | 143(2) (ඊ) මුදල් රෙගුලාසිය | ගොවිජන සේවා කාරක සභා 12 ක හිඟ මුදල් අයකර ගැනීමට විශේෂ පියවර ගෙන නොතිබුණි | බදු නොගෙවන ගොවීන්ට එරෙහිව නීත්‍යානුකූල කටයුතු කිරීමට පියවර ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (vi) | 396 (ඇ) මුදල් රෙගුලාසිය | ගොවිජන සේවා කාරක සභා 06 ක නිකුත් කළ නමුත් මාස 06 ක් ඉක්ම වූ රු.27,272 ක් වටිනා චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (vii) | 757 (2) සහ (4) මුදල් රෙගුලාසි | ගොවිජන සේවා කාරක සභා 26 ක භාණ්ඩ සමීක්ෂණ පවත්වා එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු මධ්‍යස්ථාන 33 පවත්වා ඇති අතර ප්‍රධාන කාර්යාලයේ උපදෙස් පරිදි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (viii) | 880 මුදල් රෙගුලාසිය සහ 08/2020 දරන 2020 ජුනි 25 දිනැති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 31 ක ප්‍රාදේශීය නිලධාරී සහ ආදායම් එකතු කිරීමේ නිලධාරීන් විසින් ඇප තැන්පත් කර නොතිබුණි. | නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛ** ---------------------- | | | |
| (i) | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛය | කමිටු ගොඩනැගිල්ලේ කාමර කුලියට දී ඇති විවිධ දෙපාර්තමේන්තු වෙතින් වර්ෂය ඇතුලත ලැබිය යුතු කාමර කුලී වෙනුවෙන් වර්ෂය අවසන් වීමට මාස 06 කට පෙර එම වර්ෂයේ දෙසැම්බර් දක්වා වවුචර් පිළියෙල කර ඉදිරිපත් කර කුලී මුදල් අයකර ගත යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 29 ක එලෙස කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.1,997,502 ක හිඟ කාමර කුලී ශේෂයක් පැවතුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 1992 අගෝස්තු 03 දිනැති අංක 439/92 දරන චක්‍රලේඛය හා 1995 සැප්තැම්බර් 07 දිනැති අංක 0459/95 දරන චක්‍රලේඛ | එකතු කරනු ලබන අක්කර බදු ආදායමින් සියයට 20 ක් ගොවිජන සංවර්ධන අරමුදලට ප්‍රේෂණය කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 26 ක සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,989,130 ක් එම අරමුදලට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 2016 පෙබරවාරි 09 දිනැති අංක 03/2016 දරන චක්‍රලේඛය | අහංගම ගොවිජන සේවා බලප්‍රදේශය තුල ලියාපදිංචි ගොවි සංවිධානවල ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂණ පවත්වා නොතිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | 1988 මැයි 27 දිනැති 322 | ඉඩම් ප්‍රවේණි බදු මුදල් භාරගත් දින සිට දින 14 ක් ඇතුළත | අදහස් දක්වා නැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (7/10/4/3) දරන චක්‍රලේඛය | අදාල පුද්ගලයින්ට ගෙවීමට හෝ අවුරුද්දක කාලයක් තුල භාර නොගන්නා මුදල් ගොවිජන සේවා අරමුදලට බැර කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 16 ක සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකල රු.458,113 ක ප්‍රවේණි බදු මුදල් ශේෂයක් පැවතුණි. | | |
| (v) | අංක 7/12/4/5 දරන 2021 ජූලි 15 දිනැති චක්‍රලේඛයේ 4.1.5 ඡේදය | සෑම ගොවිජන බැංකුවක් විසින්ම දිරිදීමනා ගෙවීම සඳහා අදාළ වර්ෂය තුළ කෘෂි ණය නිකුත් කිරීම අනිවාර්ය වුවද වලහන්දූව ගොවිජන බැංකුව විසින් සමාලෝචිත වර්ෂයේදී කෘෂි ණය නිකුත් කර නොමැතිව ලාභාංශ ගණනය කර තිබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් ලැබෙන උපදෙස් පරිදි අදාළ ගෙවීම් කටයුතු ඉදිරියේදී සිදු කරන බව. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (vi) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 20(2) වගන්තිය. | ඕපාත ගොවිජන සේවා කාරක සභාවේ ලේකම්වරයා විසින් දෙසතියකට වරක් තොග ලේඛන පරීක්ෂා කර අත්සන යොදා නොතිබුණි. | එකඟවන බව හා ඉදිරියේදී පරීක්ෂා කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ<br>------------ | | | |
| | අංක 2016 NFC/FCGvi චක්‍රලේඛයේ 6.4 ඡේදය | සහනාධාර පොහොර වැඩි මිලට විකිණීමෙන් ලද මුදල් රජයේ ආදායමට බැර කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් එසේ පොහොර විකිණීමෙන් ලද රු.356,224 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඉ) භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛ
-------------

| | | | |
|---|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | ඌරල ගොවිජන සේවා කාරක සභාව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි | එකඟවන බව. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2022 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 33 හි එකතුව රු.5,667,027 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු 33 හි එකතුව රු.11,111,893 ක අතිරික්තයක්ද විය. 2021 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 33 හි එකතුව රු.5,458,132 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු 33 හි එකතුව රු.11,772,542 ක අතිරික්තයක්ද විය.

#### 2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 27 ක රු.6,449,244 ක අතිරික්තයක් ලබාගෙන තිබූ අතර ඊට සාපේක්ෂව පෙර වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 26 ක අතිරික්තය රු.6,075.787 ක් විය. ඒ අනුව රු.373,457 ක අතිරික්තයේ වර්ධනයක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ කාරක සභා 06 ක ඌණතාවය රු. 782,217 ක් වූ අතර ඊට සාපේක්ෂව පෙර වර්ෂයේ කාරක සභා 07 ක ඌණතාවය රු.617,655 ක් විය. ඒ අනුව ඌණතාවයේ වැඩිවීම රු.164,562 ක් වුවද අතිරික්තයේ වැඩිවීම ගැලපීම නිසා සමස්ථ අතිරික්තය රු.208,895 කින් වැඩිවී තිබුණි.

(ආ) ගොවිජන සේවා කාරක සභාවල මූලික කාර්යභාරයක් ලෙස පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීජ හා පැළ, කෘෂි උපකරණ ඇතුළු කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීම වන අතර සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කරක සභා 33 හි මුළු අලෙවියේ එකතුව රු.24,391,912 ක් විය. මුළු දළ ලාභය එකතුව රු.2,258,943 ක් වූ හෙයින් ඒ අනුව ගොවිජන සේවා කාරක සභාවක වාර්ෂික අලෙවි වටිනාකම සාමාන්‍ය රු.739,148 ක් වූ අතර සාමාන්‍ය දළ ලාභය රු.68,452 ක් විය.

(ඇ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 33 හි මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| මුළු වත්කම් | රු. |
|---|---|
| ------------- | |
| ජංගම වත්කම් | 126,926,523 |
| ජංගම නොවන වත්කම් | 41,671,365 |
| මුළු වගකීම් | |
| ------------ | |
| ජංගම බැරකම් | 94,817,665 |
| දිගුකාලීන ණය වටිනාකම | 12,469,803 |
| සමුච්චිත අරමුදල් වටිනාකම (ශුද්ධ වත්කම්) | 61,310,420 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌරගස්මංහන්දිය ගොවිජන සේවා කාරක සභාවේ ජංගම ගිණුම් දෙකක රු.7,008 ක්ද, ගෝනදෙණිය ගොවිජන සේවා කාරක සභාවේ ජංගම ගිණුමක රු.300,000 කට අධික මුදලක්ද ඵලදායී ආයෝජනයක යෙදවීමෙන් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | මුදල් වඩාත් ඵලදායී ආයෝජනයක යෙදවීමෙන් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 05 ක හඳුනා ගන්නා ලද රු.59,235 ක මුදල් ඌණතා සහ ගොවිජන සේවා කාරක සභා 04 ක හඳුනාගන්නා ලද රු.108,329 ක තොග ඌණතා, ඊට අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුව පැවතුණි. | එකඟ වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 21 කට අදාළ ඉඩම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. පිලාන ගොවිජන සේවා මධ්‍යස්ථානය සතු ඉඩම පවරා නොගැනීම හේතුවෙන් ඉඩමේ අයිතිය අක්මීමන ප්‍රාදේශීය ලේකම් සතුව පවතී. පරිත්‍යාගයක් ලෙස ලැබී ඇති මෙම ඉඩමේ කොටසක අයිතිය සම්බන්ධයෙන් අයිතිකරු විසින් වන්දි ඉල්ලුම්කර තිබුණි. | එකඟ වන බව හ ගොවිජන සේවා මධ්‍යස්ථානය පිහිටි ඉඩම් හා ගොඩනැගිලි පවරා ගෙන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | මධ්‍යස්ථානය සතු ඉඩම් පවරාගෙන නිරවුල් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 33 සඳහා කාරක සභා අරමුදල් රු.1,085,700 ක් | එකඟවන බව. | මිලදී ගැනීමෙන් බලාපොරොත්තු වූ අරමුණු |

| | | | |
|---|---|---|---|
| | වැය කර මිලදී ගත් ඇඹිලි සලකුණු යන්ත්‍ර 2020 පෙබරවාරි, මාර්තු මාසවලදී සවිකර තිබුණි. ඇඹිලි සලකුණු යන්ත්‍රවලට අදාළ මෘදුකාංග (app එක) පරිගණක තුළ නොමැති වීම නිසා 2023 වර්ෂය වන විටත් ඇඹිලි සලකුණු වලට අදාළ ලොග් සටහන් ලබා නොගැනීමෙන් යන්ත්‍ර මිලදී ගැනීමෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටු වී නොතිබුණි. යන්ත්‍ර සවිකළ දිනයෙන් මාස 02 සිට යන්ත්‍ර අක්‍රිය වීම ආරම්භ වී තිබුණු අතර විගණනයට නිරීක්ෂණය වූ කාරක සභා 07 ක යන්ත්‍ර අක්‍රියවීම්වලින් එක් යන්ත්‍රයක් අළුත්වැඩියා කිරීමට නොහැකි බව මිලදී ගත් ආයතනය විසින් දන්වා තිබුණි. තවත් යන්ත්‍ර 03 ක් සඳහා මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා තිබුණි. | | ඉටු කර ගැනීම සහ අක්‍රිය වූ යන්ත්‍ර අළුත්වැඩියා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නෙළුව ගොවිජන සේවා කාරක සභාවේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වසම් 10 ක අක්කර බදු ගණනය කර නොතිබුණු අතර යක්කලමුල්ල හා නාගොඩ ගොවිජන සේවා කාරක සභා 02 හි වසම් 11 ක රු.164,645 ක අක්කර බදු මුදලින් කිසිදු මුදලක් අයකර නොතිබුණි. නියාගම ගොවින සේවා කාරක සභාවේ රු.52,800 ක අක්කර බදු මුදලින් රු.80 ක් පමණක් අයකර ගෙන තිබුණි. | පිළිතුරු සපයා නැත | හිඟ අක්කර බදු කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | නෙළුව ගොවිජන සේවා කාරක සභාවේ තඹලගම. වසමෙහි කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීවරයෙකු වෙත 2019 මාර්තු 13 සහ 2019 ජූලි 31 දිනවලදී නිකුත් කරන ලද කුවිතාන්සි පොත් දෙකක් නැවත භාර නොදීම සම්බන්ධ විමර්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | විමර්ශනය අවසන් කර වාර්තාව කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එනු ලබන ගොවිජන සේවා කාරක සභා 32 ක රු.12,897,612 ක් වූ ලැබිය යුතු ශේෂ 339 ක් අයකර ගැනීමටත් ගොවිජන සේවා කාරක සභා 33 ක රු.18,621,999 ක ගෙවිය යුතු ශේෂ 429 ක් නිරවුල් කිරීමටත් කටයුතු කර නොතිබුණි. | එකඟවන බව හා 2023 වර්ෂයේදී ශේෂ නිරවුල් කිරීම් සිදුවෙමින් පවතින බව. | දීර්ඝ කාලය සිට ඉදිරියට ගෙන එනු ලබන ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක වී වගාව සඳහා යෙදවිය හැකි A ශ්‍රේණියේ පුරන් කුඹුරු අක්කර 129 ක් පමණ හා වී වගාව හැර වෙනත් කෙටිකාලීන භෝග වගාවන් සඳහා යෙදවිය හැකි B ශ්‍රේණියේ පුරන් කුඹුරු අක්කර 615 ක් පමණ වී වගාව හෝ වෙනත් වගාවන් සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | පුරන් කුඹුරු ඉඩම් වී වගාව සඳහා හෝ වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.5 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 12 ක ලියාපදිංචි ගොවි සංවිධාන 262 ක ඉතුරුම් ගිණුම් ශේෂ එකතුව රු.31,433,951 ක මුදල් ගොවි සංවිධානවල අරමුණු සඳහා යොදා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | එකඟවන බව. | ගොවිජන සේවා මධ්‍යස්ථානවල ලියාපදිංචි ගොවි සංවිධාන වල ඉතුරුම් මුදල් එම ගොවි සංවිධානවල අරමුණු සඳහා යොදා ගත යුතුය. |

### 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 05 ක කෘෂි අලෙවිසැල්, කෙරදේවල ගොවිජන සේවා කාරක සභාවේ පැරණි පොහොර ගබඩාව, අහංගම ගොවිජන සේවා කාරක සභාවේ ට්‍රැක්ටර් ට්‍රේලර් 03 ක්, රෝද 04 ට්‍රැක්ටර් මැෂින් එකක් සහ වේරගොඩ ගොවිජන සේවා කාරක සභාවේ ඡායා පිටපත් යන්ත්‍රයක් වසර ගණනාවක සිට ඌන උපයෝජිතව පැවතුණි. | එකඟවන බව. | කෘෂි අලෙවිසැල්, පොහොර ගබඩා ගොඩනැගිලි කඩිනමින් ඵලදායී කාර්යයකට යොදා ගැනීමටත් ට්‍රැක්ටර් සහ ට්‍රේලර් අපහරණය කිරීමටත්, ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියා කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 02 ක නිලධාරීන් කාර්යාලයෙන් බැහැර යනු ලබන අවස්ථාවලදී බැහැර යාමේ ලේඛනයේ සටහන් කර මාණ්ඩලික නිලධාරියෙකුගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් පවත්වා ගෙන යනු ලබන එම ලේඛන මාණ්ඩලික නිලධාරියකු විසින් අනුමත කර නොතිබුණි. | එකඟවන බව හා ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | නිලධාරීන් බැහැර යන අවස්ථාවලදී ලිඛිතව අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | අහංගම ගොවිජන සේවා කාරක සභාව විසින් නිවාඩු ලේඛනයේ ලබාගත් නිවාඩු ඇතුළත් කර නිසි පරිදි යාවත්කාලීන කර නොතිබූ අතර වරු නිවාඩු හා ප්‍රමාද වී පැමිණීම් වලට අදාළ වාර්තා සටහන් පවත්වා නොතිබුණි. | එකඟවන බව හා ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | නිවාඩු ලබා ගැනීම ප්‍රමාද වී පැමිණීම් පිළිබඳ ලේඛන වාර්තා විධිමත්ව පවත්වා ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.2 පරිදි කිසියම් වර්ෂයකට අදාළ මූල්‍ය ප්‍රකාශන අදාළ මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 33 ම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 01 දින 12 සිට මාස 05 දින 22 ක කාලපරාසයක ප්‍රමාදයකින් පසුවය. | පිළිතුරු සපයා නැත. | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.2 පරිදි කිසියම් වර්ෂයකට අදාළ මූල්‍ය ප්‍රකාශන අදාළ මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 19 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, අනුමත කිරීම, ඉදිරිපත් කිරීම සඳහා වගකිව යුත්තේ කවුරුන්ද යන්න සම්බන්ධව තනි අස්ථිත්වයක (රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ ඒ හා සමාන) මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අස්ථිත්වයේ ප්‍රධාන තැනැත්තා (ප්‍රධානියා, ප්‍රධාන විධායක හෝ පාලක මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය) හෝ ඒ | පිළිතුරු සපයා නැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 19 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඊට අදාළ කාරක සභාව විසින් අනුමත කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | හා සමාන තැනැත්තෙකු වෙත වගකීම පැවරේ. ඒ අනුව ගොවිජන සේවා කාරක සභා 33 හිම ආදායම් හා වියදම් ඇස්තමේන්තු කාරක සභාව විසින් අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන කාරක සභාව විසින් අනුමත කර නොතිබුණි. | | |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 33 ම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 21 ප්‍රකාරව, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ඉදිරිපත් කර ඇති ආකෘතිය අනුව ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 21 ප්‍රකාරව, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 53 ප්‍රකාරව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති මඟින් සන්සන්දනාත්මක තොරතුරු වෙනස් ලෙස අවශ්‍ය කෙරේ නම් හෝ අවසර දී ඇත්නම් හැර මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය කාලපරිච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතුය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගොවිජන බැංකු 33 හි ම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි පෙර වර්ෂයේ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ඉදිරිපත් කර ඇති ආකෘතිය අනුව ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 53 ප්‍රකාරව ගොවිජන බැංකු විසින් පසුගිය කාලපරිච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

## 5. ගොවිජන බැංකු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවි බැංකුවක් විසින් ණයලාභියෙකු වෙත නිකුත් කරන කෘෂි ණය මුදලක් පියවීමේ උපරිම කාලය මාස 06 ක් ලෙස 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.4.2 ඡේදය ප්‍රකාරව දක්වා තිබුණද ගොවිජන බැංකු 23 ක් විසින් 2000 වර්ෂයේ සිට ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා නිකුත් කළ කෘෂි ණය මුදලින් ණය ලාභීන් 920 දෙනෙකුගේ රු.11,680,224 ක ණය මුදලක් මාස 12 සිට වසර 22 ක කාලයක් හිඟහිට තිබුණි. | අදාළ හිඟ අයකිරීම් කටයුතු විනිශ්චය සභා හා අධිකරණය මඟින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව වාරික හා පොලී මුදල් අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.8.4 ඡේදය ප්‍රකාරව රු.50,000 ක ව්‍යාපෘති ණය මුදලක් උපරිම මාස 24 ක කාලසීමාවක් තුළ ගෙවා අවසන් කළ යුතු බව දක්වා තිබුණද ගොවිජන බැංකු 29 ක් විසින් 2003 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ නිකුත් කළ මුළු ව්‍යාපෘති ණය මුදලින් ණයලාභීන් 1513 දෙනෙකුගේ රු.30,146,949 ක් ගෙවීමේ කාලය මාස 24 ඉක්මවා තිබුණි. | අදාළ හිඟ අයකිරීම් කටයුතු විනිශ්චය සභා හා අධිකරණය මඟින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව වාරික හා පොලී මුදල් අය කර ගත යුතුය. |
| (ඇ) | ගොවිජන බැංකු 13 ක් විසින් 2016 සිට 2022 වර්ෂය දක්වා නිකුත් කළ රු.100,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ණයලාභීන් 168 දෙනෙකුගෙන් රු.10,070,116 ක මුදලක් අයවීමට තිබුණි. | හිඟ අයකිරීම් කටයුතු විනිශ්චය සභා හා අධිකරණය මඟින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව වාරික හා පොලී මුදල් අය කර ගත යුතුය. |